# මගේ දඟකාර චූටි නංගියා



කවිනුලී බංඩාර

ග්‍රන්ථ නාමය :- මගේ දඟකාර චූටි නංගියා

කතාව පිටකවරය හා චිත්‍ර :- කවිනුලී බංඩාර

ISBN අංකය :- 978-624-208-051-2

මෙම කෘතියෙහි සියලුම අයිතිය කතෘ සතුය..

කතෘගේ වෙනත් කෘති : පුංචි සුරංගනාවී

ප්‍රකාශය හා පළමු මුද්‍රණය : 2023 දෙසැම්බර් 22

# පිදුම

මගේ පවුලේ සැමට , පුංචි යහළුවන්ට සහ පාසලට

කවිනුලී බංඩාර

4 ශ්‍රේණිය C

මහාමායා බාලිකා විදුහල, මහනුවර

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර


**2023.10.20**

මේ ඉන්නේ මගේ නංගී.

එයාට තාම වයස අවුරුදු 3යි.

එයාගේ නම ඔනෙලි.



ඒත් හැමෝම එයාට ආදරේට කිවුවේ කිටී කියලා. මගේ නංගී පූසෙක් වගේම හුරතල්. ඒ වගේම දඟකාරයි. වෙලාවකට හරිම මුරණ්ඩුයි, එතකොට නම් මටත් තරහා යනවා. හැබැයි.., මමයි, අයියයි, නංගිට හරිම ආදරෙයි. නංගීත් ඒ වගේ. අපි හැමදාම එයත් එක්ක සෙල්ලම් කරනවා. එයා හැංගිමුත්තං කරන්න හරිම ආසයි.



එයා හොයනකොට අපි ගිහින් ගහකට නගිනවා . එතකොට කිටී මූණ රතු කරගෙන ඉන්නවා බලන්න ආසයි. එයාට තාම ගස් නඟින්න බෑ. හැබැයි , අපි ගහෙන් බැස්සම ඔන්න ආයෙත් යාළුයි. කවදාවත් දවස් ගණන් තරහා වෙන්නේ නෑ.



දවසක් මමයි අයියයි ගෙදර තියෙන උසම ගහ මුදුනේ පුංචි ඔංචිල්ලාවක් බැන්දා. වෙලාවකට අපි නංගිව ගහ උඩට අරං ගිහින් ඔංචිල්ලාවෙන් තියනවා. එයා ඒකට හරිම ආසයි. නිවාඩු කාලේ ඉවර වුණා. අපි හෙට ඉස්කෝලෙ යන්න ලෑස්තිවෙනවා, කිටී පුදුමයෙන් බලා සිටියා.



පහුවදා උදා වුණා. අපි ඉස්කෝලේ යනකොට, එයා තාම නිදි.

හැබැයි.., අපි බස් එකට නගිනකොට මට එයා අඬන සද්දේ ඇහුණා. මට හොඳටම දුක හිතුණා. අයියටත් එහෙම වෙන්න ඇති.



ඉස්කෝලේ ඉවරවෙලා අපි දෙන්නා ගෙදර ආවා. අපි "නංගී.." කියලා කතා කළා. ඒත් නංගී සද්දයක්වත් නෑ. අපි ඔංචිල්ලාව ළඟට ගියා. එතකොට නංගීට ඔංචිල්ලාවේම නින්ද ගිහිල්ලා. අයියාටයි , මටයි හොඳටම දුක හිතුණා.



අයියායි , මමයි , නංගීව ඔංචිල්ලාවෙන් අරන් ඇඳෙන් තිබ්බා. අයියාටයි, මටයි නංගීගේ මූණ බලනකොට ගොඩාක් ආදරේ හිතුණා.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ  දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී  ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20